// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2303/23 - 2022 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2022.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.- බී 19/78 (V)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 61 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 60 වන වගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1979 ජූලි මස 2 වැනි දින අංක 43/4 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, කලින් කල සංශෝධනය කරන ලද එහි උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන උතුරු පළාත තුළ පිහිටි අධිකරණවලට අදාළ අයිතමය සහ II වන තීරයේ ඊට අනුරූපී සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීම මගින් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :

| "*I වන තීරය* *අධිකරණ* | *II වන තීරය* *නීති කෘත්‍ය හෝ කාරණා වර්ග* |
|---|---|
| නැගෙනහිර පළාත තුළ පිහිටි අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණ | යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මුල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය හෝ කාරණා" |

EOG 10 - 0243

1A - PG 6020 — 406 (2022/10)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*